# ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය
## කොළඹ
# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය
දුරකථනය: +94 (1) 249-8100 ෆැක්ස්: +94 (1) 244-9070
විද්‍යුත් තැපැල: shenjy@state.gov http://lk..usembassy.gov

නිවේදන අංක: 20170329

**සන්ධ්‍යා එක්නැළිගොඩ: ජාත්‍යන්තර දිරිය කාන්තාව**

**කොළඹ, මාර්තු 29:** මානව හිමිකම්, යුක්තිය, සාමය හා ලිංගික සමානතාව වෙනුවෙන් පෙනී සිටින කාන්තාවන්ගේ විශිෂ්ට ධෛර්ය හා කැපවීම, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවසෑම වර්ෂයකම ඇගයීමට ලක් කරයි. අද ශ්‍රී ලංකාවේ සන්ධ්‍යා එක්නැළිගොඩ ලොව පුරා තවත් කාන්තාවන් දොළොස් දෙනෙක් සමග එක්සත් ජනපද රාජ්‍ය ලේකම්ගේ 2017 වර්ෂය සඳහාවූ දිරිය කාන්තා සම්මානය ලබා ගනී. ඇගේ ස්වාමිපුරුෂයාට යුක්තිය ඉටු කරවා ගැනීමටත්, ශ්‍රී ලංකාවේ විවිධ ජනවාර්ගික හා ආගමික ප්‍රජාවන්ට අයත් පවුල්වල අතුරුදහන් වූ අය වෙනුවෙන් වෙහෙස නොබලා ගත් උත්සාහයන් වෙනුවෙන් ජනාධිපති ආර්යාව වන මෙලනියා ට්‍රම්ප් හා දේශපාලන කටයුතු පිළිබඳ උප රාජ්‍ය ලේකම් තෝමස් ඒ ෂැනොන් විසින් එක්නැළිගොඩ මහත්මියට මෙම සම්මානය ප්‍රදානය කරනු ඇත.

ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති අතුල් කෙෂාප් ප්‍රකාශ කළේ "තමන්ගේ අතුරුදහන්වූ ආදරණීයයන් පිළිබඳ තොරතුරු සොයන ශ්‍රී ලංකාව පුරා සිටින සියලු ජනවර්ගයන්ට අයත් කාන්තාවන්ගේ දැඩි උත්සාහය සහ කැපවීම, සන්ධ්‍යා නියෝජනය කරන" බවයි. "සියලු ශ්‍රී ලාංකිකයන්ට කල් පවතින සාමයක්, ප්‍රතිසන්ධානයක් හා සත්‍යය මත පදනම්වූ දීප්තිමත් අනාගයක් ලබා දීමට තබන පියවරක් ලෙස ඇමරිකන් ජනතාව මෙම ප්‍රයත්නයන්ට සහාය දක්වයි."

ඇගේ ස්වාමිපුරුෂයා වූ ප්‍රගීත් 2010 දි අතුරුදහන් කිරීමෙන් පසු ඇගේ ප්‍රශ්නවලට පිළිතුරු ලබා ගැනීමත්, එයට වගකිවයුතු අපරාධකරුවන් සොයා ගැනීමත් සඳහා වාර 90කට වැඩි ගණනක් ඇය උසාවියේ පෙනී සිට ඇත. යුද්ධයෙන් විනාශවූ උතුරු නැගෙනහිර පළාත් ඇතුළු ශ්‍රී ලංකාව පුරා අතුරුදහන් වූවන්ගේ පවුල්වලට සහයෝගය දැක්වීමට ඇය රට පුරා සංචාරය කරයි.

තම ව්‍යාපාරය ගැන සඳහන් කරමින් සන්ධ්‍යා කියා සිටියේ "සත්‍යය සොයා යෑම අපරාධයක් නොවන බවත්, අපරාධකරුවන් ආරක්ෂා කිරීම අපරාධයක්" බවත් ය.

සම්මාන ලබන 13 දෙනා තෝරා ගෙන ඇත්තේ ළමා විවාහවලට විරුද්ධවීම, ලිංගිකත්වය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වය, නීති විරෝධී මිනිස් ප්‍රවාහනය, අන්තර් ආගමික සබඳතා වැඩි දියුණු කිරීම හා පරිසරය රැක ගැනීම වැනි විවිධ අංශවල ක්‍රියාකාරීන් අතරෙනි. ඔවුන් මුහුණ දුන් අභියෝගයන් ගැන සාකච්ඡා කිරීමටත් ක්‍රියාකාරී වීමට අන් අය දිරිගැන්වීමටත් ඔවුන් එක්සත් ජනපදය හරහා විවිධ නගරවලට සංචාරය කරනු ඇත.

2007 වර්ෂයේ මෙම සම්මානය ආරම්භ කිරීමෙන් පසුව රාජ්‍ය දෙපාර්තමේන්තුව, රටවල් 60ක කාන්තාවන් 100කට පමණ මෙම සම්මානය පුද කර තිබේ. අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන් වෙනුවෙන් 2010 වර්ෂයේ දී පුත්තලමේ ජන්සිලා මජීඩ්ට මෙම සම්මානය හිමි විය.

"කිසිදාක සටන අත් නොහැරිය යුතු"යයි නායකත්වය හා ධෛර්ය ගැන සාකච්ඡා කරමින් සන්ධ්‍යා කීවාය. "අද කොතරම් දුෂ්කරතාවලට මුහුණ දුන්නත් අනාගතයේ කවදා හෝ ධනාත්මක ප්‍රතිඵලයක් ලැබෙනු ඇත."